# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 161 — 1975 අප්‍රේල් 24 වැනි බ්‍රහස්පතින්ද — 1975.04.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන — — | 295 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 293 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තා — ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය — — ... | 293 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — ... | 299 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය — ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... | — |


සැ. යු.—ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත 1975 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

1975 අංක 195

අංකය : ඩී/පීඑජ්/36.

යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1975 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කර්නල් වශයෙන්—

මේජර් උපාලි රණසිංහ, ශ්‍රීලංඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ඊ. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් 10 වැනි දින,
කොළඹ දී ය.

4-516—75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

## වෙනත් පත් කිරීම් ආදිය

1975 අංක 196

| | |
|---|---|
| පා4/1/53/74 (වා) | පා4/1/33/දිසා/75 |
| පා4/1/64/74 (වා) | පා4/2/132(4)11) |
| පා4/1/81/74 (වා) | පා4/2/15 |
| පා4/1/32/74 (වා) | පා4/2/22 |
| පා4/1/106/75 (වා) | පා4/2/24 |
| පා4/1/119/75 | පා4/2/35 |

1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 37 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම—

1. එච්. ඈම්. අබේසිංහ මහතා, නුවරඑළිය අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

2. විතානආරච්චිගේ සොමිපාල මහතා, මාතර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

3. තන්තිරිවත්තගේ ගුණපාල මහතා, මාතර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ ඈම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1974 ජනවාරි මස 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

293—බී 71707—10,719 (75/04)

4. ජිනදාස කණ්ඩම්බි මහතා, මාතර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

5. එස්. තිරුනාවුක්කරසු මහතා, පේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

6. නාගප්පර් ගනේෂසිංහරාජා මහතා, පේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

7. ජී. ඩී. සුගතදාස මහතා, මතුගම අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

8. තල්ල පෙරුමාල් මුදලිපට් දවුල්ඩ මුල් ගෙදර පණ්ඩිතරත්න මහතා, කුලියාපිටිය අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

9. ඩී. ඩබ්ලිව්. එච්. ජයවික්‍රම මහතා, පොලොන්නරුව අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

10. නිතිඥ විත්ස්ටන් ලෙනාඩ් මැලවන මහතා, රත්නපුර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

11. මුත්තර් කන්දයියා මහතා, යාපනය දිස්ත්‍රික්කයේ මූහමාලෙයි ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, චාවකච්චේරි අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

12. පොන්නයියා ඈතාඹිටම්බි මහතා, යාපනය දිස්ත්‍රික්කයේ මුල්ලිපත්තු ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, චාවකච්චේරි අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

13. හෙන්ද්‍රික් සිංඤෝ ගුණරත්න මහතා, පුත්තලම්-හලාවත දිස්ත්‍රික්කයේ කාක්කපල්ලිය ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, හලාවත අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

14. මොහමඩ් කාසිම් අබ්දුල් හමීඩ් මහතා, අම්පාර දිස්ත්‍රික්කයේ කරවාකු දකුණ ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, කල්මුනේ අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

15. මොහම්මදු ඉස්මායිල් අබ්දුල් සමාද් හජ්ජියාර් මහතා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, කුරුණෑගල අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

16. විල්ප්‍රඩ් සූරියආරච්චි මහතා, ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, උඩුගම අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

17. සේන ජයලාල් මද්දුම බණ්ඩාර විජයගුණවර්ධන මහතා, රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල සුළුනගර සභා ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, බලංගොඩ අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

18. මානවඩුගේ චාල්ස් ගුණවර්ධන මහතා, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර මහ නගර සභාවේ කොට්ඨාශ අංක 1, 2, 3, 4, 5, 6 සහ 7 ඇතුළත් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, රත්නපුර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

19. ලිදමුලගේ විල්ප්‍රඩ් සිල්වා මහතා, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර මහ නගර සභාවේ කොට්ඨාශ අංක 8, 9, 10, 11, 12, 13, 14 සහ 15 ඇතුළත් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුළ, රත්නපුර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

20. ඇම්. ජී. පී. බණ්ඩා මහතා, මාතලේ දිස්ත්‍රික්කයේ ගැඹුරුඔය කොට්ඨාශයේ (මාරක සහ හැඳුන්ගමුව යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ඇතුළත්) මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මාතලේ අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

21. බද්දේලියනරාලගේ දොන් කාලෝ මහතා, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර නගර සභා කොට්ඨාශයේ මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ, කළුතර අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

22. වන්නිආරච්චිගේ ජයසේන මහතා, මොණරාගල දිස්ත්‍රික්කයේ, උඩවලව කොට්ඨාශයේ (උඩවලව ග්‍රාමසේවක කොට්ඨාශය ඇතුළත්) මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ, ඇඹිලිපිටිය අධිකරණ කොට්ඨාශය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

23. එච්. සී. ගුණවර්ධන මහතා, කොළඹ කච්චේරියේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරි ධුරය දරණ කාලය තුළ, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

24. තෙවරාතන්ත්‍රිගේ මෙනිසන් ලක්දුන් ප්‍රනාන්දු මහතා, ප්‍රවාහණ අමාත්‍යාංශයේ මහජන සම්බන්ධතා නිලධාරි ධුරය දරණ කාලය තුළ, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

25. ගරුමුණි ආතර් ලෝරන්ස් මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

පත් කරමි.

පීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1975 අප්‍රේල් මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4–521/3 —75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

1975 අංක. 197

1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 68 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම—

පා 4/හමප 21/18.

1. වන්නිආරච්චිගේ ජයසේන මහතා, මොණරාගල දිස්ත්‍රික්කයේ උඩවලව කොට්ඨාශය (උඩවලව ග්‍රාමසේවක කොට්ඨාශය ඇතුළත්) සඳහා මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද,

පා 4/මප/3/18.

2. බද්දේලියනරාලගේ දොන් කාලෝ මහතා, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර නගර සභා කොට්ඨාශය සඳහා මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

පා 4/හමප 5/15.

3. එම්. ජී. පී. බණ්ඩා මහතා, මාතලේ දිස්ත්‍රික්කයේ ගැඹුරුඔය කොට්ඨාශය (මාරක සහ හැඳුන්ගමුව යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ඇතුළත්) සඳහා මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

පී. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1975 අප්‍රේල් මස 11 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

4–521/2—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 68 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම—

පා 4/මප 1/22.

1. වෛතිලිංගම් බාලසිංහම් මහතා, වවුනියා දිස්ත්‍රික්කයේ පුතුකුඩි ඉරිප්පු ගම්සභා ප්‍රදේශයේ මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් කරන ලද පත්වීම

වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

පී. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1975 අප්‍රේල් මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

4–521/1—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

1975 අංක 198

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ:—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ආර්. පී. විමලසේන මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු, ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එල්. ජී. ආර්. කාරියවසම් මහතා 1975.01.24 දින සිට නැවත නියමයක් කරන තුරු, මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. ඩී. රණවීර මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරනතුරු, ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. අරුණසිරි මහතා 1975.01.20 දින සිට නැවත නියමයක් කරනතුරු සංස්කෘතික කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒස්. එච්. එම්. චන්ද්‍රසේන මහතා 1975.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිවිල් පාලන නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජේ. සෙන්තිල් නාදන් මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරනතුරු, ග්‍රාමීය ආයතන හා පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. එස්. ගුණසේකර මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු, ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. බී. සුමනපාල මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරනතුරු, ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. පී. ඩබ්ලිව්. වීරවර්ධන මහතා 1974.01.01 දින සිට නැවත නියමයක් කරනතුරු, ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික පලදාවර්ධන නීති සහකාර අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. මහාදේව මහතා 1974.12.23 දින සිට නැවත නියමයක් කරනතුරු, දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. ජයහන්තන් මහතා 1974.10.01 දින සිට නැවත නියමයක් කරනතුරු, සමූපකාර සංවර්ධන උප කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. එම්. ජේ. සේනාරත්න මහතා 1970.07.06 දින සිට නැවත නියමයක් කරනතුරු, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අතිරේක ගොඩබෑම් සමීක්ෂක තනතුරේ සිය රාජකාරීවලට අතිරේකව, යාපනයේ සහකාර රේගු අයකැමි වශයෙන් වැඩ බැලීමට.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 04 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.

4–434—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

(සතුරන් සමග වෙළඳාම් කිරීම පිළිබඳ) 1939 ආරක්ෂක නියෝග

1948 පෙබරවාරි මස 05 වන දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත (සතුරන් සමග වෙළඳාම් කිරීම පිළිබඳ) 1939 ආරක්ෂක නියෝගවල 6 අ වන නියෝගයෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්, වැඩ බලන මහා භාරකාර මහින්ද අභය ඇල්ලෙපොල මහතා, ඔහු මහා භාරකරු වශයෙන් වැඩ බලන කාලය තුළදී, 1974 දෙසැම්බර් මස 2 වන දින සිට සතුරු දේපළ භාරකරුව සිටීමට පත් කොට ඇත.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 01 වෙනි දින,
අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

4–533—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1975 01. 24 වැනි දින අංක 147/69 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, කිරි ආහාර-ඔස්ටර් මිල්ක් පිළිබඳ අංක සී 558 දරණ ආහාර මිල නියෝගය විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1975. 04. 10 වන දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1975 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4–510/1—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1975 01. 16 වැනි දින අංක 146/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, කිරි ආහාර-ලැක්ටෝජන් පිළිබඳ අංක සී 557 දරණ ආහාර මිල නියෝගය විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1975. 04. 10 වන දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1975 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4–510/2—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1974 දෙසැම්බර් මස 11 වැනි දින අංක 141/6 සී දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1974 අංක 2 දරණ (මෝටර් වාහන සඳහා "කැළණි" වර්ගයේ ටයර් සහ ටියුබ්) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1975. 04. 10 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1975 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4–508—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1975 ජනවාරි මස 09 වැනි දින අංක 145/10 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1975 අංක 1 දරණ (ඇස්බැස්ටෝස් තහඩු) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1975. 04. 10 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1975 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4-506—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

### සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

#### 29 (3) දරන වගන්තිය යටතේ කරන නිවේදනය

(129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ පිහිටුවා ඇති වේතන විනිශ්චය මණ්ඩලය විසින් කරන ලද්දවූ ද, එම පනතේ 28 වැනි වගන්තිය යටතේ ස්ථිර කරන ලද්දවූද, මෙහි පහත සඳහන් තීරණයේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් සාප්පුවල සහ එම සාප්පුවලට අදාළ කාර්යාලවල සේවයේ නියුක්ත සේවකයින් වෙනුවෙන් වූ තීරණය කම්කරු ඇමතිතුමන් විසින් ස්ථිර කරන ලද බව එම පනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගොගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දීය.

#### තීරණය

1. මෙහිවූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් සෑම සාප්පුවකම සහ එම සාප්පුවලට අදල කාර්යාලවල සේවයේ නියුක්ත මෙහි පහත නිශ්චිතව සඳහන් සේවක පංතිවලට මේ තීරණය අදල විය යුතුය :—

(1) සාප්පු සේවක පිරිමි ළමයින්, ඇහුරුම්කරුවන්, පියන්වරුන්, පණිවුඩ ගෙනයන ළමුන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, හරිවැරදි බලන්නෝ කවුන්ටරයේ සේවය කරන ළමුන්, පාපැදි ළමුන්, ඔඩර්ලිවරුන් සහ කම්කරුවෝ ;

(2) විකුණුම්කාරියන් ඇතුළුව විකුණුම්කරුවෝ ;

(3) යතුරු ලියන්නන් සහ ලෙජර් ලිපිකරුවන් ඇතුළු ලිපිකරුවෝ ;

(4) අයකැමියෝ ;

(5) බෙහෙත් මිශ්‍ර කරන්නෝ සහ රසඥයෝ.

2. පළවෙනි ජෙදයේ සඳහන්, යම් සාප්පුවක සහ කාර්යාලයක සේවයෙහි යොදවා ඇති යම් සේවකයෙකු සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය පහත සඳහන් ආකාරයට විය යුතුය :—

| මාසයක් සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය | සේවක පන්තිය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සේවා වර්ෂය | සාප්පු සේවක පිරිමි ළමුන්, ඇහුරුම්කරුවන්, පියන්වරුන්, පණිවුඩ ගෙනයන ළමුන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, හරිවැරදි බලන්නෝ, කවුන්ටරයේ සේවය කරන ළමුන්, පාපැදි ළමුන්, ඔඩර්ලිවරුන් සහ කම්කරුවෝ | | විකුණුම් කාරියන් ඇතුළුව විකුණුම්කරුවෝ | | යතුරු ලියන්නන් සහ ලෙජර් ලිපිකරුවන් ඇතුළුව ලිපිකරුවෝ | | අයකැමියෝ | | බෙහෙත් මිශ්‍ර කරන්නෝ සහ රසඥයෝ | |
| | රු. | ශත | රු. | ශත | රු. | ශත | රු. | ශත | රු. | ශත |
| රැකියාවේ යෙදී ඇති 1 වැනි සේවා වර්ෂය තුළ | 100 | 0 | 140 | 0 | 150 | 0 | 175 | 0 | 250 | 0 |
| රැකියාවේ යෙදී ඇති 2 වැනි සේවා වර්ෂය තුළ | 105 | 0 | 150 | 0 | 160 | 0 | 185 | 0 | 260 | 0 |
| රැකියාවේ යෙදී ඇති 3 වැනි සේවා වර්ෂය තුළ | 110 | 0 | 160 | 0 | 170 | 0 | 195 | 0 | 270 | 0 |
| රැකියාවේ යෙදී ඇති 4 වැනි සේවා වර්ෂය තුළ | 115 | 0 | 170 | 0 | 180 | 0 | 205 | 0 | 280 | 0 |
| රැකියාවේ යෙදී ඇති 5 වැනි සේවා වර්ෂය තුළ | 120 | 0 | 180 | 0 | 190 | 0 | 215 | 0 | 290 | 0 |
| රැකියාවේ යෙදී ඇති 6 වැනි සේවා වර්ෂය තුළ | 125 | 0 | 190 | 0 | 200 | 0 | 225 | 0 | 300 | 0 |
| රැකියාවේ යෙදී ඇති 7 වැනි සේවා වර්ෂය තුළ | 130 | 0 | 200 | 0 | 210 | 0 | 235 | 0 | 310 | 0 |
| රැකියාවේ යෙදී ඇති 8 වැනි සේවා වර්ෂය තුළ | 135 | 0 | 210 | 0 | 220 | 0 | 245 | 0 | 320 | 0 |
| රැකියාවේ යෙදී ඇති 9 වැනි සේවා වර්ෂය තුළ | 140 | 0 | 220 | 0 | 230 | 0 | 255 | 0 | 330 | 0 |
| රැකියාවේ යෙදී ඇති 10 වැනි සේවා වර්ෂය තුළ | 145 | 0 | 230 | 0 | 240 | 0 | 265 | 0 | 340 | 0 |
| රැකියාවේ යෙදී ඇති 11 වැනි සේවා වර්ෂය තුළ | 150 | 0 | 240 | 0 | 250 | 0 | 275 | 0 | 350 | 0 |
| රැකියාවේ යෙදී ඇති 12 වැනි සේවා වර්ෂය තුළ | 157 | 50 | 250 | 0 | 260 | 0 | 285 | 0 | 360 | 0 |
| රැකියාවේ යෙදී ඇති 13 වැනි සේවා වර්ෂය තුළ | 165 | 0 | 260 | 0 | 270 | 0 | 295 | 0 | 370 | 0 |
| රැකියාවේ යෙදී ඇති 14 වැනි සේවා වර්ෂය තුළ | 172 | 50 | 275 | 0 | 285 | 0 | 305 | 0 | 380 | 0 |
| රැකියාවේ යෙදී ඇති 15 වැනි සේවා වර්ෂය තුළ | 180 | 0 | 290 | 0 | 300 | 0 | 315 | 0 | 390 | 0 |
| රැකියාවේ යෙදී ඇති 16 වැනි සේවා වර්ෂය තුළ | 187 | 50 | 305 | 0 | 315 | 0 | 325 | 0 | 400 | 0 |
| රැකියාවේ යෙදී ඇති 17 වැනි සේවා වර්ෂය තුළ | 195 | 0 | 320 | 0 | 330 | 0 | 335 | 0 | 410 | 0 |
| රැකියාවේ යෙදී ඇති 18 වැනි සේවා වර්ෂය තුළ | 202 | 50 | 335 | 0 | 345 | 0 | 345 | 0 | 420 | 0 |
| රැකියාවේ යෙදී ඇති 19 වැනි සේවා වර්ෂය තුළ | 210 | 0 | 350 | 0 | 360 | 0 | 355 | 0 | 430 | 0 |
| රැකියාවේ යෙදී ඇති 20 වැනි සේවා වර්ෂය තුළ | 217 | 50 | 365 | 0 | 375 | 0 | 365 | 0 | 440 | 0 |
| රැකියාවේ යෙදී ඇති 21 වැනි සේවා වර්ෂය තුළ | 225 | 0 | 380 | 0 | 390 | 0 | 375 | 0 | 450 | 0 |
| රැකියාවේ යෙදී ඇති 22 වැනි සේවා වර්ෂය තුළ | 232 | 50 | 395 | 0 | 405 | 0 | 375 | 0 | 465 | 0 |
| රැකියාවේ යෙදී ඇති 23 වැනි සේවා වර්ෂය තුළ සහ ඊට පසු සෑම වර්ෂයක් තුළම | 240 | 0 | 410 | 0 | 420 | 0 | 375 | 0 | 480 | 0 |

3. මෙම තීරණය ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ සේවයේ යෙදී සිටින, ඉහත සඳහන්වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් පරිදි ඔවුන්ට අදාල අවම ඒකාබද්ධ වේතන ප්‍රමාණයන්ට වැඩිවූ සම්පූර්ණ මාසික වේතන ලබන්නාවූ සේවකයින්, එහි දක්වා ඇති වේතන ක්‍රමයේ ඊළඟ වේතන පියවරවල් දෙකක් මත තැබිය යුතුය.

4. මේ තීරණයේ කාර්‍ය්‍ය සඳහා—

(1) " විකුණුම්කරුවෝ " යනුවෙන් (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්‍ය්‍යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ අර්ථානුකූලව පාරිභෝගිකයින්ට වෙළඳාම් කිරීමේ කාර්‍ය්‍ය සඳහා යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ ;

(2) " සාප්පුවේ පිරිමි ළමයා " යනුවෙන් සිල්ලර වැඩ කිරීමට යොදවා ඇති තැනැත්තෙකු අදහස් වන අතර ඊට ඇහුරුම්කරුවෙක්, පියන්වරයෙක්, පණිවුඩ ගෙනයන ළමයෙක්, බඩුබාහිරාදිය බෙදන ළමයෙක්, කවුන්ටරයේ සේවය කරන ළමයෙක්, පාපැදි ළමයෙක් සහ ඔඩොක්ලීවරයෙක් ද ඇතුළත් වේ ;

(3) " ලිපිකරුවෙකු " යනුවෙන් යතුරු ලිවීම සහ ගිණුම් වැඩ ඇතුළු සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් ලිපිකාර වැඩෙහි නියුක්ත තැනැත්තෙක් අදහස් වේ ;

(4) " අයකැමියෝ " යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් මුදල් භාරගැනීමට සහ හෝ ගෙවීමටද, මුදල් භාරව සිටීමටද, අවශ්‍ය වාර්තා සහ පොත්පත් පවත්වාගෙන යාමට සහ විධාන කළ විට මුදල් බැංකුවේ තැන්පත් කිරීමේ නියුක්ත වීමටද, යොදවනු ලබන තැනැත්තෙක් අදහස් වේ ;

(5) " කම්කරුවකු " යනුවෙන් ඕනෑම නුපුහුණු කාර්‍ය්‍යයක් කිරීමට යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ ;

(6) " බෙහෙත් මිශ්‍ර කරන්නෝ " හෝ " රසඥයෝ " යනුවෙන් ලංකා වෛද්‍ය ආඥාපනත යටතේ බෙහෙත් මිශ්‍රකරන්නන් වශයෙන් ලියාපදිංචිවූ අය අදහස් වේ.

## උපලේඛනය

| | | |
|---|---|---|
| 1. | සීමාසහිත කාර්ගිල්ස් (ලංකා) | 3/2, දළද වීදිය, මහනුවර |
| 2. | ද සෙන්ට්‍රල් මෙඩිකල් ස්ටෝර්ස් | 20, දළද වීදිය, මහනුවර |
| 3. | ඩීන් ස්ටෝර්ස් | 30, කාසල් වීදිය, මහනුවර |
| 4. | ගෝමස් කොම්බයින්ස් | 851, පේරාදෙණිය පාර, මහනුවර |
| 5. | සීමාසහිත මහනුවර ආයුර්වේද ඖෂධ වෙළඳ සමාගම | 56, යටිනුවර වීදිය, මහනුවර |
| 6. | කැන්ඩි මෙඩිකල් ස්ටෝර්ස් | 96, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර |
| 7. | මාර්කට් මෙඩිකල් ස්ටෝර්ස් | 200, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 8. | ජී. ඩබ්ලිව්. ෆාමසි සහ ස්ටෝර්ස් | 91, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර |
| 9. | ෆාමසි රෙක්ස් | ඉන්ෂුවරන්ස් බිල්ඩිං, 23, දළද වීදිය, මහනුවර |
| 10. | ශ්‍රී ලංකා ෆාමසි | 39, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර |
| 11. | ජයන්තිස් (රෙදිපිළි) | 106, කොළඹ වීදිය, මහනුවර |
| 12. | ෂාරාස් | 203, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 13. | ආරිය සළුපිළිහල | 13ඒ, කොටුගොඩැල්ල වීදිය, මහනුවර |
| 14. | එස්. එම්. අලි සහ සමාගම | 85, කොළඹ වීදිය, මහනුවර |
| 15. | බටික් හවුස් | 39, මඩවල පාර, කටුගස්තොට |
| 16. | චන්ද්‍රා සිල්ක් හවුස් | 58, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර |
| 17. | සිලෝන් ටෙක්ස්ටයිල්ස් | 9, කුරුණෑගල පාර, කටුගස්තොට |
| 18. | ධවලගිරි ස්ටෝර්ස් | 37, කොළඹ වීදිය, මහනුවර |
| 19. | දස්වානිස් සමාගම | රජින හෝටල ගොඩනැගිල්ල, මහනුවර |
| 20. | පැෂන්ස් | 17, යටිනුවර වීදිය, මහනුවර |
| 21. | හාජි අබ්දුල් ලතිප් වයුබ සහ පුත්‍රයෝ | 104, කොළඹ වීදිය, මහනුවර |
| 22. | හෙන්රි ස්ටෝර්ස් | 60, කොළඹ වීදිය, මහනුවර |
| 23. | නිව් සිලෙක්සන්ස් | 102, කොළඹ වීදිය, මහනුවර |
| 24. | සී. එම්. කේ. ජයසුන්දර | 192, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 25. | ජින්නාස් | 23, යටිනුවර වීදිය, මහනුවර |
| 26. | ජුනයිඩ ස්ටෝර්ස් | 25, යටිනුවර වීදිය, මහනුවර |
| 27. | බාන් ටෙක්ස්ටයිල්ස් | 184, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 28. | කැන්ඩි ටී ස්ටෝර්ස් | 2–11, යටිනුවර වීදිය, මහනුවර |
| 29. | කන්නඩි බායි ස්ටෝර්ස් | 82, කොළඹ වීදිය, මහනුවර |
| 30. | ලංකා ස්ටෝර්ස් (ටෙක්ස්ටයිල්ස්) | 75, කොළඹ වීදිය, මහනුවර |
| 31. | මර්ජාන් ස්ටෝර්ස් | 16, කුරුණෑගල පාර, කටුගස්තොට |
| 32. | මිහිඳුගිරි ස්ටෝර්ස් | 35, කොළඹ වීදිය, මහනුවර |
| 33. | ඇම්. ඇස්. ඇස්. මොහොමඩ් | 97, මඩවල පාර, කටුගස්තොට |
| 34. | මොඩන්ස් | 9, යටිනුවර වීදිය, මහනුවර |
| 35. | සීමාසහිත මවුලානා (ලංකා) | 77, කොළඹ වීදිය, මහනුවර |
| 36. | එච්. ඒ. එච්. මුසා සහ පුත්‍රයෝ | 70, කොළඹ වීදිය, මහනුවර |
| 37. | මුතාලිබ් සහ සහෝදරයෝ | 88, කොළඹ වීදිය, මහනුවර |
| 38. | මයි ඕන් ස්ටෝර්ස් | 72, කොළඹ වීදිය, මහනුවර |
| 39. | නඩරාජාස් | 40, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| 40. | එස්. නල්ලමුත්තු පිල්ලෙයි | 74, කොළඹ වීදිය, මහනුවර |
| 41. | පලයකාට්ස් | 76, කොළඹ වීදිය, මහනුවර |
| 42. | ටී. එස්. පිච්චෙයි සහ සමාගම | 189, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 43. | ක්වීන්ස් පැලස් | 204, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 44. | රගුලාන්ස් | 87, කොළඹ වීදිය, මහනුවර |
| 45. | රාජා ස්ටෝර්ස් | 89 සහ 91, කොළඹ වීදිය, මහනුවර |
| 46. | රහමතුල්ලා | 68, කොළඹ වීදිය, මහනුවර |
| 47. | රන්ජනාස් | 201, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 48. | රාධා ටෙක්ස්ටයිල්ස් | 58, කොළඹ වීදිය, මහනුවර |
| 49. | රෆීක් ස්ටෝර්ස් | 185, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 50. | රපීඩ සහ පුත්‍රයෝ | 51, මඩවල පාර, කටුගස්තොට |
| 51. | රෝයල් පැලස් | 187, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 52. | රෝයල් ෆාමසි | 85, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර |
| 53. | සරදස් ස්ටෝර්ස් | 64, කොළඹ වීදිය, මහනුවර |
| 54. | සරස්වතී ස්ටෝර්ස් | 90, කොළඹ වීදිය, මහනුවර |

| | | |
|---|---|---|
| 55. | සේනක ස්ටෝර්ස් | 46, දළද වීදිය, මහනුවර |
| 56. | ශාන්ති ස්ටෝර්ස් | 53, කොළඹ වීදිය, මහනුවර |
| 57. | ෂර්ට හවුස් | 177, මධ්‍යම වෙළඳපොල, මහනුවර |
| 58. | සීමාසහිත සිසිර ඩිස්ට්‍රබියුටර්ස් | 61, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර |
| 59. | සිවාජී එම්පෝරියම් | 69, කොළඹ වීදිය, මහනුවර |
| 60. | ශ්‍රී මුරුගන් ස්ටෝර්ස් | 94, කොළඹ වීදිය, මහනුවර |
| 61. | එස්. පී. කේ. සුප්පයියා පිල්ලෙයි සහ සහෝදරයෝ | 28, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| 62. | වජ් මහල් | 87, මඩවල පාර, කටුගස්තොට |
| 63. | තව්තිසය | 40, කොළඹ වීදිය, මහනුවර |
| 64. | යුටිලිටීස් | 12, කොටුගොඩැල්ල වීදිය, මහනුවර |
| 65. | වාසුමාල්ස් | 3, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| 66. | විජිත ස්ටෝර්ස් | 8, යටිනුවර වීදිය, මහනුවර |
| 67. | විජයාස් | 32, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර |

4–503—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

**1954 අංක 12 දරණ කිරි මණ්ඩල පණත**

**නිවේදනයයි**

1957 අංක 9 සහ 1964 අංක 18 දරණ පනත්වලින් සංශෝධිත පරිදි 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පණතේ 4(1) වැනි වගන්තිය යටතේ ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් ඒ. පී. බී. මනම්පේරි මහතා 1975 මාර්තු මස 27 වැනි දින සිට ජාතික කිරි මණ්ඩලයේ සභාපති වශයෙන් පත්කර ඇති බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. ඇම්. සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් ලේකම්.

1975 අප්‍රේල් මස 02 වැනි දින;
කොළඹ 2,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ දීය.

4–485—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : පී 23/කො. 136/74.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වූන කාර්මික ආරවුල් පනත**

**4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එල්. නිව්ටන් පෙරේරා අංක 35 බී, ඇන්ඩර්සන් පාර, කළුබෝවිල, දෙහිවල සහ වැල්ලවත්ත ස්පිනින් ඇන්ඩ් වීවින් මිලස් ලිමිටඩ්, තැ. පෙ. 320, කොළඹ, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, පොලිස් පාක් ඇවනිව්හි අංක 11 දරණ ස්ථානයේ පදිංචි නිතිඥ අයිවන් පෙරේරා මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

**131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ඇල්. නිව්ටන් පෙරේරා, අංක 35 බී, ඇන්ඩර්සන් පාර, කළුබෝවිල, දෙහිවල

සහ

වැල්ලවත්ත ස්පිනින් ඇන්ඩ් වීවින් මිල්ස් ලිමිටඩ්, තැ. පෙ. 320, කොළඹ, අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශනය**

වැල්ලවත්ත ස්පිනින් ඇන්ඩ් වීවින් මිල්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් ඇල්. නිව්ටන් පෙරේරා මහතා සේවයේ නොයෙදවීම යුක්ති සහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1975 මාර්තු මස 19 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනයෙදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4–495—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

අංකය : පී. 23/කො. 234/74.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

**131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් ඩබ්. බී. ඩී. එස්. පෙරේරා මහතා, නො. 17, 1 වන චැපැල් පටුමග, වැල්ලවත්ත සහ අනික් පාර්ශ්වය වශයෙන් සී/ස. අල්හම්බ්‍රා හෝටල් සමාගම, අංක 30, සර් මොහමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 3 අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, ගවර් වීදියේ අංක 26 දරණ ස්ථානයේ පදිංචි නිව්ටන් එදිරිසිංහ මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

**131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශ්වයක් වශයෙන් ඩබ්. බී. ඩී. එස්. පෙරේරා මහතා, 17, 1 වන චැපැල් පටුමග, වැල්ලවත්ත සහ අනික් පාර්ශ්වය වශයෙන් සී/ස. අල්හම්බ්‍රා හෝටල් සමාගම, අංක 30, සර් මොහොමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 3 අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශනය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,—සී/ස. අල්හම්බ්‍රා හෝටල් සමාගම විසින්, "හොලිඩේ ඉන්" ආයතනයේ සේවය කළ ඩබ්. බී. ඩී. ඇස්. පෙරේරා මහතා සේවයෙන් පහකිරීම යුක්තියහගතද යන්න සහ ඔහුට කුමන සහනයන් හිමිද යන්නත් පිළිබඳව වේ.

1975 මාර්තු මස 19 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනයොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

4–496—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සංවිධානය—දකුණු දිසාව**

ගාළු දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ වඳුරඹ—ඇතුමලේ—යක්කදුව පාරේ අංක 7/5 දරණ පාලම නැවත තැනීම සඳහා 1975. 5. 15 දින සිට පාලම තැනීමේ කටයුතු අවසන් කොට නැවත දන්වන තුරු එම පාරේ 7 වන සැතපුමේ නාගොඩ හන්දියත් කුරුපනාව හන්දියත් අතර කොටස සියළුම රථ වාහන සඳහා වසා තබනු ලැබේ.

එම කාලය තුල විකල්ප මාර්ගය යටලමත්ත—ගෝනදෙනිය—නාගොඩ පාර වේ.

එස්. පත්මනාදන්,
දකුණු දිසා මැඩි අධ්‍යක්ෂ.

1975 අප්‍රේල් මස 11 වන දින,
ගාල්ලේ,
දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කායසීලයේදී ය.

4–499—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

**ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

**දුම්රිය හරස් මාර්ග අලුත් වැඩියා කිරීම—මාතලේ මාර්ගය**

වත්තේගම හා උකුවෙල දුම්රිය ස්ථාන අතර සැ. 11 ද. 46 දරණ ස්ථානයේ හා නුවර-මාතලේ, වත්තේගම හරහා වැටී ඇති මහා මාර්ගයේ සැ. 09. ද. 00 දරණ ස්ථානයේ ඇති දුම්රිය හරස් මාර්ගය 1975.05.10 වැනි දින පැය. 18.00 සිට 1975.05.11 වැනි දින පැය.. 06.00 දක්වා අලුත්වැඩියා කරනු ලැබේ.

මෙම මාර්ගය රථවාහන ගමනාගමනය සඳහා 1975.05.10 වැනි දින පැය. 18.00 සිට පැය. 22.00 දක්වාද 1975.05.11 වැනි දින පැය. 04.00 සිට පැය. 06.00 දක්වාද අර්ධ වශයෙන් වසා තබනු ලැබේ.

රථවාහන ගමනාගමනය සඳහා 1975.05.10 වැනි දින පැය. 22.00 සිට 1975.05.11 වැනි දින පැය. 04.00 දක්වා සම්පූර්ණ වශයෙන් වසා තබනු ලැබේ.

මාර්ගය අර්ධ වශයෙන් වසා තබන කාල සීමාව තුළදී සියලුම රථවාහන මෙම හරස් මාර්ගය හරහා යෑමට කටයුතු සලස්වනු ල.බේ. සම්පූර්ණ වශයෙන් වසා තබන කාල සීමාව තුළදී, ඉතාමත් අත්‍යාවශ්‍ය වාහන පමණක් මෙම මාර්ගය හරහා යැවීමට කටයුතු කරනු ලැබේ.

ලං. ග. ම. : නුවර හා මාතලේ : නුවර හා මාතලේ අතර ධාවනය කරනු ලබන බස් සේවාවන්, අලවතුගොඩ-කුඹියන්ගොඩ හරහා ඇති මාර්ගයේ ධාවනය කරවීමට කටයුතු කළ යුතුය.

එස්. අමරසූරිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

4–455—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

ණය අංකය : 1856

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1974 සැප්තැම්බර් 23 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙසින් නිවේදනය කරනු ලැබේ:—

"ප්‍රසිද්ධ නොතාරිස් වන ජේ. ඇස්. පරණවිතාන විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරනු ලද අංක 4459 හා 58. 11. 7 දින දරණ බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් මාතර, රාහුල පාරේ "සිදේවී" හි පදිංචි බියට්‍රිස් සෝමාවතී ධර්මපාල (මේජර් සී. ඒ. ධර්මපාල මහතාගේ භාර්යාව) නමැති අය විසින් පැහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙහදස් පනස් හතයි සත තිස්තුනක මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින්ද, එකී අංක 4459 දරණ බැඳුම්කරය යටතේ එකී සංස්ථාවට උකස්කර ඇත්තාවූ දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ පෝරඹකතංකේ පිහිටි අංක 2199 දරණ ප්ලෑන ප්‍රකාර අ. 42, රු. 0, ප. 35 ක ප්‍රමාණවත් නකංකේ මත්තේ ලොට් බී දරණ ඉඩම.

මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ පාලමුව ගමේ පිහිටි (බැද්දෙගෙවත්තේහේන නොහොත් බැද්දෙගෙහේන, බිදිච්චවැව, දුනුකෙයියවත්ත, බටකැටියෙවත්ත, අල්වත්ත සහ පින්කොරටුව නමැති ඉඩම් වලින් සමන්විත) උනැල්ල වත්ත නමැති අංක 2590 දරන ප්ලෑන ප්‍රකාර අ. 44, රු. 1, ප. 30 ක ප්‍රමාණවත් ඉඩම.

එකී පාලටුවේ පිහිටි එකී අංක 2590 දරණ ප්ලෑනේ ලොට් ජේ වශයෙන් දන්වා ඇති අ. 0, රු. 3, ප. 34 ක ප්‍රමාණවත් බටකැටිය හෝ තුඹුවේකැබැල්ල නමැති ඉඩම. මාතර පදිංචි බලයලත් වෙන්දේසිකරුවූ ඇම්. එච්. ජොහැන්නස් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්, එසේ විකුණා එකී මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් එවකට අයවිය යුතුව ඇති පොලියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුත් සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම හා කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසින් තීරණය කරයි."

එච්. ඇස්. ඇජ්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

75. 4. 1, කොළඹ 3.

4–531—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

---

**වන්දනා ගමන් ආඥාපනත**

**පෙරියපුල්ලුමලේ ශුද්ධ ජපමාල දේවස්ථානයේ උත්සවය—1975**

යථොක්ත උත්සවය 1975 අප්‍රේල් මස 25 දින පටන්ගෙන 1975 මැයි මස 4 වැනි දින දක්වා පවත්වනු ලබන බව එකී උත්සවය සඳහා පැමිණෙන අයගේ සහ අනිකුත් සියලුම දෙනාගේම දැනගැනීම පිණිස මෙසින් ප්‍රකාශ කරමි.

1963 අගෝස්තු මස 9 දින අංක 13,722 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ නිවේදනය කරන ලද නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේත් අවධානය මෙසින් යොමු කරවමි.

එඩ්ගා ප්‍රනාන්දු,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති.

1975 අප්‍රේල් මස 17 දින,
මඩකලපු දිසාපති කාර්යාලයේදීය.

4–534—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය
### 1975

| මාසය | | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 75.04.04 | සිකුරාද | ... | 75.03.27 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 75.04.11 | සිකුරාද | ... | 75.04.04 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.04.18 | සිකුරාද | ... | 75.04.11 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.04.24 | බ්‍රහස්පතින්ද | ... | 75.04.18 | සිකුරාද | දවල් | 12.00 |
| මැයි | ... | 75.05.02 | සිකුරාද | ... | 75.04.24 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 75.05.09 | සිකුරාද | ... | 75.05.02 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.05.16 | සිකුරාද | ... | 75.05.09 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.05.23 | සිකුරාද | ... | 75.05.16 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.05.30 | සිකුරාද | ... | 75.05.23 | සිකුරාද | දවල් | 12.00 |
| ජූනි | ... | 75.06.06 | සිකුරාද | ... | 75.05.30 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.06.13 | සිකුරාද | ... | 75.06.06 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.06.20 | සිකුරාද | ... | 75.06.13 | සිකුරාද | දවල් | 12.00 |
| | | 75.06.27 | සිකුරාද | ... | 75.06.20 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී